# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

### II වැනි ශ්‍රේණියේ සෞඛ්‍ය ඕවර්සියර් තනතුරු

1966. 1. 21 දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ නම් ලැයිස්තුවට තවදුරටත් ය. 1964. 1. 31 දින ගැසට් පත්‍රයේ පළකරන ලද දැන්වීමේ ප්‍රකාර ඉහත සඳහන් තනතුරු සඳහා පහත නම් සඳහන් අපේක්ෂකයාද පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් තෝරාගෙන ඇති බව මෙයින් දැනුම් දෙමි:—

ඊ. ජී. චන්ද්‍රරත්න—ගැටනගෙවත්ත, නිවිතිගල.

මෙම අපේක්ෂකයින්ට වහාම පත්වීම් දීමට කොමිෂන් සභාව භාරගනු නොලැබේ. පත්වීම් දෙනු ලබන්නේ එම තනතුරු සඳහා පුරප්පාඩු ඇතිවූ විටය.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 මාර්තු මස 16 වැනි දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

4–571—66.4.15 දින අංක 14,691 දරණ ගැසට් පත්‍රය

---

# අය-වැය ලේඛන

## හික්කඩුව සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් නියෝග අංක 40(11), යටතේ කෙරෙන අයදුම් පතයි

### අය–වැය ලේඛණය—1966

1966 වර්ෂයේ වැය සම්මතයන්ගෙන් ඉතිරිවේයයි ගණන් බලන ලද මුදල්, අනාය වැය සම්මතයන්හි අනුරූප අතිරේක මුදල් පියවා ගැනීම සඳහා යෙදවීම, 1966 මාර්තු මස 27 වැනි දින පවත්වනු ලැබූ හික්කඩුව සුළු නගර සභාවේ මාසික රැස්වීමේදී අංක 5(ආ) දරණ යෝජනා ස්ථිරත්වය අනුව පහත සඳහන් අන්දමට සම්මත කරගන්නා ලදී.

පළමුවැනි කොටස—සාමාන්‍ය

| ඉතිරි වැය | රු. ශ. | අතිරේක ප්‍රතිපාදන | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—(2) සංස්ථා වියදම්— | | සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි— | |
| (ඩී) තක්සේරු ගාස්තු ... ... ... | 890 0 | (7) අළුත් කර්මාන්ත ... ... ... | 890 0 |

ඒ. වී. පියදස,
සභාපති,
හික්කඩුව සුළු නගර සභාව.

1966 අප්‍රියෙල් මස 5 වැනි දින,
හික්කඩුව සුළු නගර සභා කායර්‍යාලයේ දීය.

4–570—66.4.15 දින අංක 14,691 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## මාතර නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (277 වැනි අධිකාරිය)

මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වෙන අය විසින් මස් විකිණීම සඳහා 1966 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව මාතර පළාත් ආණ්ඩු සභාව තුල පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසා යයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවෙන දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වැනි අධිකාරයේ අංක 7 දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

| අයදුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඇස්. ඇස්. ඇම්. සේගු නෙයිනා මහතා, 13, පෙනිකුවික් පාර, මාතර ... | හරක් මස් සහ එළු මස් ... | මාතර නූපේ මස් කඩය |

විල්ප්‍රඩ් ගුණසේකර,
මාතර නගර සභාවේ සභාපති.

1966.3.30 වැනි දින,
මාතර නගර සභා කාර්යාලයං.

4–581—66.4.15 දින අංක 14,691 දරන ගැසට් පත්‍රය

---

## ගෙවල් කුලී සීමා පණත

### රක්වාන සුළු නගර සභා ප්‍රදේශය

1949 අප්‍රේල් මස 22 වෙනි දින අංක 9,969 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලවූ 1949 ගෙවල් කුලී සීමා රෙගුලාසිවල අංක 3 දරණ රෙගුලාසිය අනුව කෙරෙන දැනුම් දීමයි. (274 පරිච්ඡේදය වන) ගෙවල් කුලී සීමා පණතේ විධි විධාන අනුව, රක්වාන සුළු නගර සභා ප්‍රදේශයට සීමිත වූ ගෙවල් කුලී පාලක මණ්ඩලය වෙත එවනු ලබන ඉල්ලුම් පත්‍ර පහත සඳහන් කරනු ලබන ලිපිනයට එවිය යුතුය :—

" සභාපතිතුමා,
ගෙවල් කුලී පාලක මණ්ඩලය,
මාරගල වලව්ව,
අටකලන් පන්න.

2. මෙම ආඥාපණත යටතේ යතොක්ත මණ්ඩලය වෙත ලැබෙන අයදුම්පත් සලකා බැලීම සඳහා මණ්ඩලයේ සභා රැස්වීම් පහත සඳහන් කරනු ලබන ස්ථානයෙහි පවත්වනු ලැබේ.

සුළු නගර සභා කාර්යාල ගොඩනැගිල්ල, රක්වාන.

පී. ඩී. ඒකනායක,
රක්වාන ගෙවල් කුලී පාලක මණ්ඩලයේ සභාපති.

1966 මාර්තු මස 26 වෙනි දින,
අටකලම්පන්නේ, මාරගල වලව්වේදීය.

4–568—66.4.15 දින අංක 14,691 දරන ගැසට් පත්‍රය

